# කොටි දඩයම හා දිවයින

දෙමළ ත්‍රස්තවාදී කොටි සංවිධානය සමූලඝාතනය කෙරී ඇතැයි කිවහොත් නිවැරදි ය. ඇතැම්විට තවමත් කොටි ත්‍රස්තවාදීන් කිහිප දෙනකු ජීවත්ව සිටිනවා විය හැකි ය. එහෙත් ඔවුනට තවත් බෝම්බයක් දෙකක් පිපිරවීම හැරෙන්නට වෙනත් කළ හැකි දෙයක් නැත. බ්‍රිතාන්‍යන්ගේ හා අනෙක් බටහිරයන්ගේ ආධාරය ඇතිව වුව ද දෙමළ ත්‍රස්තවාදීන් කිහිප දෙනකුට කළහැකි දෙයක් නැත. යම් ආකාරයකින් ප්‍රභාකරන් ජීවත්ව සිටියේ නම් බ්‍රිතාන්‍යන් හා අනෙක් බටහිරයන් ඔහු ලවා එතෙර ඊළමක් පිහිටුවන ලද බවට ප්‍රකාශයක් නිකුත් කරවාගැනීමට තිබුණි, දැන් වුවත් බ්‍රිතාන්‍යන් වෙනත් කවරකු යටතේ වුව ද එවැන්නක් කරගැනීමට ඉඩක් ඇත. ප්‍රශ්නය වනුයේ ඒ සඳහා වෙනත් කිසිවකු දැනට සොයාගැනීමට නො හැකි වීම ය. ප්‍රභාකරන් මේ අවස්ථාවේ දී ඝාතනයවීම කොටි සංවිධානය හා බ්‍රිතාන්‍ය ලත් පරාජයක් මිස වෙනත් දෙයක් නො වෙයි.

බටහිර රටවල සිටින සිංහලයන්ට හා පන්සල්වලට පහර දීම් නම් තවදුරටත් වාර්තා වෙයි. පිටරට විසිරී සිටින දෙමළ ජාතිවාදීන් ඒ රටවල ආධාරයෙන් ලංකාවේ තානාපති කාර්යාලවලට හා සිංහලයන්ට එරෙහිව කෙණෙහිලිකම් ටික කාලයක් කරනු ඇත්තේ දෙමළ ජාතිවාදය තවමත් පරාජය වී නොමැති බැවිනි. විශේෂයෙන් ම බ්‍රිතාන්‍ය තව තවත් දෙමළ ජාතිවාදය පෝෂණය කිරීමට එරට විසිරී සිටින දෙමළ ජනයා යොදාගනු ඇත. එහෙත් ඒ කෙණෙහිලි දිගින් දිගට ම පවත්වාගෙන යා හැකි ක්‍රියාවලියක් නො වේ. එසේ වුවත් දෙමළ ජාතිවාදය හා දෙමළ බෙදුම්වාදය බටහිරයන්ගේ අනුග්‍රහයෙන් තවදුරටත් පවතිනු ඇති බැවින් ඒ පරාජය කිරීමට වැඩ පිළිවෙළක් අවශ්‍ය වෙයි.

කෙසේ වෙතත් දෙමළ ජාතිවාදය පැරදවීමට අපේ වීරෝදාර හමුදා සමත් වී ඇත. විනය අතින් මෙන් ම මෙහෙයුම්වලින් ද අපේ හමුදාවන් ලෝකයේ සිටින විශිෂ්ට ම හමුදා බවට පත් වී ඇත. ත්‍රස්තවාදයට එරෙහිව කරන සටන්වලදී ලෝකයේ අනෙක් රටවලට උපදෙස් දීමට අපේ හමුදාවන්ට හැකි බව අමුතුවෙන් කිවයුතු නො වේ. හමුදාපතිවරුන් විශේෂයෙන් ම ජෙනරල් සරත් ෆොන්සේකා මහතා විශිෂ්ටත්වයට පත් වී ඇත. එහෙත් අපේ හමුදාවලට මෙවැනි වික්‍රමයක් කළහැකිවූයේ කෙසේ ද? කොටි එතරම් දක්ෂයන් නොවන බව පැහැදිලි ය. ඔවුන් හා ඔවුන්ගේ නායක ප්‍රභාකරන් පුම්බනු ලැබුයේ බටහිර හා මෙරට ජාතිද්‍රෝහී ජඩමාධ්‍ය විසිනි. පත්තර විසින් පුම්බන ලද කොටි කඩදාසි කොටි වූහ. එහෙත් ඇතැම්විට අපේ හමුදාවන්ට ද නොතිබූ අවි ආයුධ ඔවුන්ට බටහිරයන් විසින් ලබා දී තිබුණි. එබැවින් කඩදාසි කොටි වුව ද කොටින් පරාජය කිරීම සැබවින් ම වීර ක්‍රියාවක් විය. එහෙත් අපේ හමුදා මෙයට පෙර ද තිබිණි. එකල ඔවුන්ට කළ නොහැකි වූ කාර්යයක් මෙවර කිරීමට හැකි වූයේ හමුදාවන්ට නිවැරදි දේශපාලන හා හමුදා නායකත්වයක් ලැබුණු බැවිනි. හමුදා නායකත්වය හමුදාපතිවරුන්ගෙන් ද ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගෙන් ද දේශපාලන නායකත්වය අන් කිසිවකුගෙන් නොව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගෙන් ද ලැබිණි. ඒ සියල්ල අප විසින් අගය කෙරෙන අතර කාලිංග මාඝ පරාජය කිරීමෙන් පසු විජාතික බලවේගවලට එරෙහිව අප ලත් විශිෂ්ටම හමුදා ජයග්‍රහණය මේ යැයි සිතමි. එළාර පරාජය කෙළේ කවුරුන්දැයි ඇසුවහොත් අප දෙන පිළිතුර ගැමුණු කුමරු ය. එහි දී ද වීරෝදාර භටයන් විශාල කැපකිරීමක් කළ බව නිසැක ය. එහෙත් ගැමුණු කුමරුගේ දේශපාලන නායකත්වය නොවන්නට ඒ සිදු නොවේ. එමෙන් ම රුවන්වැලිසෑය ගොඩනැගුවේ කවුරුන්දැයි ඇසුවොත් එයට දෙන පිළිතුර ද ගැමුණු රජු මිස එකල සිටි කාර්මික ශිල්පීන් නො වේ. ඇතැම් තුට්ටු දෙකේ මාක්ස්වාදීන් බොරු ජනතාවාදීන් ජනප්‍රියත්වය සඳහා රුවන්වැලිය නිර්මාණය කෙළේ එකල සිටි මේසන්වරුන් යැයි කියනු ඇත. එහෙත් ඒ පඬියන් ම තමන්ගේ නිවස ගැන කියන්නේ ඒ එක්කෝ තමන්, එසේත් නැත්නම් තමන්ගේ පියා හෝ සීයා හෝ කරවූ බව මිස මේසන්ලා කළ බවක් නො වෙයි. මොවුහු ව්‍යාජ මතවාදයකින් දෙකකින් හිස උදුම්මාගත් පඬියෝ හා පඬියෝ පමණක් ම වෙති.

ජනාධිපතිතුමා බටහිරයන්ගේ උපදෙස් පිළිනොගන්නේ නම් ඔවුන්ගේ බලපෑම්වලට යටත් නොවන්නේ නම් කොටි පරාජය කළ හැකි බව අපි දැන සිටියෙමු. ඒ බව නොයෙකුත් අවස්ථාවල අපි කීවෙමු. බටහිරයන්ගේ බලපෑම්වලට යටත් නොවී සිටීම පහසු කාර්යයක් නො වෙයි. ඒ දේශපාලනික ආර්ථික හා සංස්කෘතික තලවල ක්‍රියාත්මක වෙයි. මෙරට සිටින රාජ්‍ය නොවන සංවිධාන ද මේ බලපෑම් කිරීමේ එක් ඉත්තෙකි. රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රමුඛ එ ජා පක්ෂය තවත් ඉත්තෙකි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ නිවට සේවකයන් වූ මොවුන්ට අමතර ව එවැනි ම වූ ඊනියා

© Prof. Nalin De Silva

උගත්තු ද සිටියහ. ප්‍රබුද්ධ යැයි කියන සිනමාකරුවෝ, එවැනි ම කසිකබල් නාට්‍යකරුවෝ, තුට්ටු දෙකේ ගීත රචකයෝ, පඬි විචාරකයෝ ආදී විජාතික බලවේගවල ඒජන්තයන් වූ කලාකරුවෝ ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ඇබිත්තයෝ වූහ. දෙමළ ජනතාවට දෙමළ වීම නිසාම ඇති ප්‍රශ්නය කුමක් දැයි ඇසූවිට ඒ තේරුම් ගත නොහැකිව වතුවල සේවය කරන දෙමළ කම්කරුවන් උදාහරණයට ගත් ව්‍යාජ කවියෝ ද ඒ අතර වූහ. සිංහල ජනයා ද වතුවල කුලීකරුවන් ලෙස සේවය කරන බව මේ පඬියෝ අමතක කළහ. බෞද්ධයන්ට යුද්ධ කළ හැකි දැයි ඇසූ, රෙපරමාදු බුද්ධාගමක් ගැන කතාකළ ඊනියා සමාජවිද්‍යා මහාචාර්යවරු, දෙමළ ජනයාට සිදු වී ඇති අසාධාරණයක් ගැන නන් දෙඩවූ කසිකබල් උගත්තු මතවාදී ව බටහිරයන්ගේ බලපෑම් ඉදිරියට ගෙන ගියෝ ය. මේ අතර මෙරට සිටින ජඩමාධ්‍යකරුවන් තමන්ට ද නොතේරෙන වචන යොදා ගනිමින් සිංහලයන් විසින් කෙරෙන්නේ යැයි කී අසාධාරණකම් ගැන පඬිවදන් ලිවූහ, කිවෝ ය.

අවුරුදු විසිපහකට අධික කාලයක් තිස්සේ මේ හා තවත් මතවාද පරාජය කර සිංහලයනට මතවාදී නායකත්වය ලබාදුන්නේ දිවයින පුවත්පත ය. දේශපාලන හා හමුදා නායකත්වවලට අමතර ව මතවාදී නායකත්වය ද කොටින්ට විරුද්ධව කළ සටනේ දී යම් පමණකට වුවත් වැදගත් බව පිළිගත යුතු ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ මතවාදී ආධිපත්‍යය පාසල්, විශ්වවිද්‍යාල, රාජ්‍ය නොවන සංවිධාන, ඇතැම් පූජකවරු හා මෙරට ඇති දහසකුත් එකක් ජඩමාධ්‍ය ඔස්සේ පමණක් නොව ඇතැම් ප්‍රභූ යැයි සම්මත භික්‍ෂූන් වහන්සේ ඔස්සේ ද සිංහලයන් මත පටවද්දී එයට විරුද්ධව ඉන්ද්‍රඛීලයක් සේ නැගී සිටියේ දිවයින ය. අද ජයග්‍රහණයේ සියළු ප්‍රතිඵල වචන පමණක් දන්නා තුට්ටු දෙකේ නිවේදකයන් ඔස්සේ තමන් ම නෙළාගැනීමට සැරසෙන ජඩමාධ්‍ය නාලිකාවල ගැත්තන් හා ඉහත සඳහන් කළ ප්‍රබුද්ධයන් දිවයින හැඳින්වූයේ ජාතිවාදී පඬංගුව කියා ය. දිවයිනට ජාතිවාදී පඬංගුව යැයි කී පඬියෝ අද අන් කාටත් වඩා දෙමළ ත්‍රස්තවාදයට විරුද්ධවන්නේ ජාතිකත්වයක් නිසා නොව බඩගෝස්තරවාදය හා හුදු බාල හා ලාබ ජනප්‍රියත්වය උදෙසා බව පැහැදිලි ය. ඕනෑම අයකුට තම මතවාද වෙනස්කර ගැනීමට හැකි බව අපි දනිමු. යමකු විජාතික මතවාද අත්හැර ජාතික මතවාද වැළඳ ගන්නේ නම් අප ඒ අගය බළ යුතු ය. එහෙත් මේ ජඩමාධ්‍යකරුවන් එසේ නොවන බව පැහැදිලි ය. ඔවුන් අව්‍යාජ පිරිසක් නම් අවුරුදු විසිපහකට අධික කාලයක් තිස්සේ ඔවුන්ගේ ද ඇණුම් බැනුම් රැවිලි ගෙරවිලි මැද දිවයින පුවත්පත කළ සේවය අගය කළ යුතු ය. එහෙත් අද සියල්ලන්ට ම ඇතැම්විට දිවයින කියවූ පාඨකයන්ට ද දිවයිනේ කැපවීම හා  කාර්යභාරය අමතක වී තිබීම කණගාටුදායක ය.

ඊනියා සාමකාරයන් සාම වෙළඳාමේ යද්දී ඇතැමුන් සුදු නෙළුම් ගෙන අවලම් තවලම් යද්දී ඔවුන්ගේ නිරුවත හෙළි කෙළේ දිවයින ය. ඒ එදා ද දිවයිනට ජාතික ප්‍රතිපත්තියක් තිබූ බැවිනි. දිවයිනෙහි ද පඬියකු දෙදෙනකු නොසිටියා නො වේ. එහෙත් දිවයිනේ මතවාදය සැකසුවෝ ජඩමාධ්‍යකරුවෝ නොවූහ. සාම සාකච්ඡාවලින් සාමයක් උදා නොවනබව දිවයින කියා සිටියේ ය. පඬියෝ ජාතිවාදී පඬංගුව යැයි කීමට අමතරව දිවයින යුදවාදී යැයි කීවෝ ය. පඬියන්ගේ හදවත් දෙමළ ජාතිවාදය වෙනුවෙන් උණු වී වෙඬරු පිඬක් මෙන් දිය වී ගියේ ය. එහෙත් දිවයින කියා සිටියේ කොටි පරාජයකිරීමෙන් තොරව සාමයක් උදා නොවන බව ය. අද දශක තුනකට පසුව සාමය උදා වී ඇත. ඒ සාමය උදා වීම ගැන බාල නිවේදකයෝ තොරතෝංචියක් නැතිව කියවති. එහෙත් ඔවුන් ද ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨයන් ද ඔවුන් සේවය කරන ජඩමාධ්‍ය ද එකල කියා සිටියේ සාම සාකච්ඡා කිරීමට ය. ජනාධිපති රාජපක්‍ෂ මහතා ද සාම සාකච්ඡාවල නිරත වී නම් ඒ සඳහා අවලමුන් පිටත් කෙළේ නම් අදත් සාමයක් නැතිවනවා පමණක් නොව මේ වන විට කොටි බ්‍රිතානීන්ගේ හා අනෙක් බටහිරයන්ගේ ආධාරයෙන් ඔවුන්ට ලැබී තිබුණු ආයුධ ශක්තියෙන් මුළු ලංකාව ම ඊළමක් බවට පත්කිරීමට තිබුණි. එහෙත් අද අවලමුන් දේශපාලනයේ නන්නත්තාර වී ඇති අන්දම දැකගත හැකි ය. සාමකාරයන් අද බෙහෙතකටවත් සොයාගැනීමට නො හැකි ය. සාමය උදා වූයේ සාමකාරයන්ගේ ගඳ ගසන ඩොලර් පවුම් අතුරන ලද මග ගොස් නොව දිවයින පෙන්වා දුන් ජාතිකත්වයේ මග ගැනීමෙනි. ඒ අන් මගක් නොව අපේ රජදරුවන්ගේ ගමන් මග විය. දිවයින පෙන්වූ මගෙහි ගිය මහින්ද රාජපක්‍ෂ මහතා බටහිරයන් ඉදිරියේ කකුල් වෙවුලන්නකු නොවී පැරණි රජදරුවන්ගේ තේජස විරාජමාන කරමින් බටහිරයන්ට කීකරු නොවී අවශ්‍ය දේශපාලන නායකත්වය ලබාදීමට සමත් වී ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva